# ඡායා රූ පිළිසඳර

2009 ජූලි/අගෝස්තු

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය
Educational and News Bulletin of The National Photographic Art Soceity of Sri Lanka

## මහාබෝධි සිතුවම් සිසු අයිතියට



මහාබෝධි විද්‍යාලයේ තාප්පයේ චිත්‍ර ඇඳීමේ ව්‍යාපෘතියක් පසුගිය දා සංවිධානය කෙරුණි. මෙම බිතුසිතුවම් පෙළ ජූලි 21 වන දින පෙරවරුවේ බස්නාහිර පළාත් අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂතුමන් සහ ලංකෙම් සමාගමේ ලාංඡන කළමනාකාරතුමිය අතින් සිසු අයිතියට පවරා දෙනු ලැබිණි.

## ද්වි වාර්ෂික සුහද හමුව

දෙවසරකට වරක් පැවැත්වෙන සාමාජික සුහද හමුව නුදුරු දිනෙක නාරාහේන්පිට ශාලිකා ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට විධිවිධාන යොදා ඇත. ඒ සඳහා පවුලේ සියලු දෙනා ද සමග සහභාගි වන මෙන් නවක සහ පැරණි සියලු සාමාජික භවතුන්ට දයාබරත්වයෙන් යුතුව ඇරයුම් කෙරේ. වැඩි විස්තර මී ලඟ පිළිසඳරෙන්.

## පාඨමාලා විද්‍යාර්ථීන්ගේ ආලෝකකරණ වැඩමුළුව

*ඡායාරූප ශිල්ප ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවන හා තෘතීය භාග විද්‍යාර්ථීන් ඉලක්ක කොටගෙන ආලෝකකරණය පිළිබඳ අදියර තුනක වැඩමුළුවක් පැවැත්වීමට විධිවිධාන යොදා ඇත. අගෝස්තු 05 වන පොහෝ දින පෙ.ව. 8.00 ට මෙම වැඩමුළුව පණ්ඩුක ද සිල්වා, හසිත ලියනගේ, ශාන්ත ගුණරත්න යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් කළුබෝවිල සංගම් මූලස්ථානයේ දී ආරම්භ කෙරේ. මූලික ආලෝකකරණ සිද්ධාන්ත, ආලේඛ්‍ය රූප ආලෝකනය, නිර්මාණාත්මක ආලෝකකරණය යන අංශ මෙයට ඇතුළත් ය.*

## සංගමයේ 56 වන වාර්ෂික මහා සභා රැස්වීම

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 56 වන වාර්ෂික මහා සභා රැස්වීම 2009 ජූනි මස 21 වන දින පෙ.ව. 9.00 ට කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ, මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි. මේ සඳහා සංගමයේ සාමාජික සාමාජිකාවෝ දෙසීයකට අධික සංඛ්‍යාවක් සහභාගී වූහ. එදින 2009/2010 වර්ෂය සඳහා නව අධ්‍යක්ෂ මණ්ඩලයක් තෝරා පත්කර ගන්නා ලදී. මේ අනුව පත් වූ නව අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වේ.

| | |
|---|---|
| සභාපති | ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර මහතා |
| විධායක අධ්‍යක්ෂ | ටී.එස්.ටී. සිල්වා මහතා |
| මුදල් අධ්‍යක්ෂ | එච්. සුනිල් ලියනගේ මහතා |
| ලේඛකාධිකාරී | එන්.ආර්. අභයසිංහ මහතා |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | සිතුමිණි රත්නමලල මහතා |
| ප්‍රකාශන අධ්‍යක්ෂ | ශාන්ත ගුණරත්න මහතා |
| ප්‍රදර්ශන අධ්‍යක්ෂ | අතුල රණරාජ මහතා |
| සමාජ සේවා අධ්‍යක්ෂ | කේ.ජී. කීර්තිරත්න මහතා |
| සංවර්ධන හා ප්‍රවර්ධන අධ්‍යක්ෂ | නාරද අමරතුංගආරච්චි මහතා |

## විල්සන් හෑගොඩ 25 වන සැමරුම් වැඩසටහන

සංගමයේ ආදි කතෘ දිවංගත විල්සන් හෑගොඩ සූරීන්ගේ 25 වන අනුස්මරණ දිනය නිමිත්තෙන් ලේ දන්දීමේ වැඩසටහනක් සහ බෝධිපූජාමය පිංකමක් සංවිධානය කිරීමට සමාජ සේවා අංශය පියවර ගෙන ඇත. සැප්තැම්බර් 13 වන දින නාරාහේන්පිට ජාතික ලේ දීමේ මධ්‍යස්ථානයේ දී ලේ දන්දීමේ කාර්‍යය සිදුකෙරෙන අතර එදින ම සවස කොළඹ 10, පියදාස සිරිසේන මාවතේ, ශ්‍රී ලංකා විද්‍යාලයේ (ඕඩේ පන්සල) දී ද බෝධිපූජාමය පිංකම සිදුකිරීමට බලාපොරොත්තු වේ. මේ සම්බන්ධ වැඩිමනත් තොරතුරු සහ ඔබේ දායකත්වය සමාජසේවා අධ්‍යක්ෂ කේ. ජී. කීර්තිරත්න (071-4458144) මහතා වෙතින් විමසන්න.

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
තැපෙ 452 කොළඹ

## පරිපාලන චක්‍රලේඛ මාලාව

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය සිය ව්‍යවස්ථාවෙන් සැපයෙන ප්‍රතිපාදන පරිදි ඒ ඒ විෂය ක්ෂේත්‍රයන්හි කාර්‍යය පද්ධති විධිමත් කරලීම අරබයා චක්‍රලේඛ මාලාවක් නිකුත් කොට ඇත. පසුගිය නිල වර්ෂ දෙක තුළ චක්‍රලේඛ 10 ක් නිකුත් කර ඇති අතර සංගමයේ සියලු කටයුතු ඊට අනුකූලව සිදු කිරීමට සියලු විධිවිධාන යොදා තිබේ.

මෙය මුද්‍රිත ප්‍රකාශනයක් ලෙස සකස් කොට ඔබ අතට පත්කිරීම අතිශයින් වැදගත් කාර්යයක් වුව ද ඒ සඳහා සැලකිය යුතු තරම් ප්‍රතිපාදන වැයකිරීමට සිදු වේ. එබැවින් මෙවර පිළිසඳර කලාපයේ පටන් මෙම චක්‍රලේඛ මාලාව ඔබ අතර පත් කිරීමට පියවර ගෙන තිබේ.

එහෙත් සාමාජික භවතුන් අතරින් කවරෙකුට හෝ මෙම චක්‍රලේඛ මුද්‍රණය සඳහා අනුග්‍රහය දැක්වීමට ඉදිරිපත් විය හැකි නම් එය කුඩා පුස්තිකාවක් ලෙසින් ඔබතට පත් කිරීමට ද හැකියාව ඇති බව කරුණා-වෙන් සලකන්න.

## ඡායාරූප විෂයය කලා මණ්ඩලයේ අවධානයට

අප සංගමය සංස්කෘතික අමාත්‍යාංශයෙන් කරනු ලැබූ ඉල්ලීමකට අනුව අභිනවයෙන් පත්කළ කලා මණ්ඩලය යටතේ චිත්‍ර හා මූර්ති අනුමණ්ඩලයේ විෂය පථය යටතට ඡායාරූප ශිල්පය ද ඇතුළත් කර ඇත. එහි විෂය නියෝජනය පිණිස අනුමණ්ඩල සාමාජික වශයෙ-යන් සංගමයේ සභාපති ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර මහතා පත්කර තිබේ.

## සාමාජිකත්වය ආරක්ෂා කර ගනිමු.

සංගමයේ පැවැත්ම උදෙසා වන ඔබේ ආර්ථික අතහිත දීම, 2009 වසර සඳහා වන සාමාජික මුදලයි. මෙතෙක් එය නොගෙවූයෙ-ය් නම්, ගරු මුදල් අධ්‍යක්ෂ ප්‍රියන්ත අමරසිංහ මහතා හෝ මුදල් කමිටුවේ නියෝජිතයෙකු වෙත සාමාජික මුදල ලබා දී සාමාජිකත්වය තහවුරු කරගන්න. සංගමයේ සෑම කාර්යයක දී ම ඔබේ වලංගු සාමාජික හිමිකම, එනම් හැඳුනුම්පත සහ වාර්ෂික සාමාජික ගාස්තු ගෙවූ රෝස පැහැති කාඩ්පත ඔබ සතු ව තිබීම අත්‍යවශ්‍ය වේ.

## මහාචාර්ය පල්ලියගුරු විශ්‍රාම ගනී.

සංගමයේ ගරු සභාගී සාමාජිකයකු වන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු මහතා විශ්ව විද්‍යාල සේවයෙන් විශ්‍රාම ගත්තේ ය. සිංහල සාහිත්‍යයට මෙන් ම ඡායාරූප ශිල්පයට, සිනමාවට හා සංස්කෘතික අධ්‍යයනයට ද මාහැඟි ග්‍රන්ථ රාශියක් රචනා කළ ඒ මහතාගේ ශාස්ත්‍රීය සේවාව ඉදිරියේ දී වඩාත් ප්‍රතිභාන්විත ලෙස කරගෙන යාමට ශක්තිය ධෛර්යය පතමු.

## වාර්ෂික දෙදින චාරිකාව

ප්‍රිය සාමාජික/සාමාජිකාවනි,

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 2009 වාර්ෂික චාරිකාව සැප්තැම්බර් මස 26 සහ 27 යන දිනවල රිටිගල, සීගිරිය (නව කෞතුකාගාරය) දඹුල්ල (ලෙන් චිත්‍ර ඡායාරූපකරණය) සහ එඬේරගල ආශ්‍රිත ඓතිහාසික ප්‍රදේශවල පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

චාරිකාවට අයකිරීම රු. 1500.00 කි. (26 දින උදෑසන කෑමබීම සහ පසු දින දිවා ආහාරය ද ඇතුළුව) සවස තේපැන්, චාරිකාව අතරතුර නතරවන තැනක දී තමන් විසින් සපයාගත යුතු අතර, පවුලේ අයව ද චාරිකාව සඳහා සහභාගී කරගත හැකි ය.

චාරිකාවට සහභාගී වන අය අගෝස්තු මස 30 ඉරුදිනට පෙර ආපසු ගෙවනු නොලබන රු. 1000.00 ක අත්තිකාරමක් ගෙවිය යුතු ය. එම අයට ආසන කලින් වෙන් කර තබන අතර, ඉන් පසුව ලැබෙන ගෙවීම් පිළිබඳ සලකා බලනු නොලැබේ.

චාරිකාව සැප්තැම්බර් මස 25 වන දින රාත්‍රී 9.00 ට පිටකොටුව, ගුණසිංහපුර ප්‍රතිමාව අසලින් පිටත්වන අතර, සුදුසු පටල පටි, ත්‍රිපාදපීඨ හා පිගානක්, කෝප්පයක්, බෙඩ් ෂීට්, වැනි අවශ්‍ය උපකරණ ද රැගෙන ප.ව. 8.30 වන විට එම ස්ථානයට පැමිණෙන්න. චාරිකාව සඳහා සහභාගී වන සියලු දෙනා තම ජාතික හැඳුනුම්පත අනිවාර්යයෙන් රැගෙන ආ යුතු අතර, සියලු ම සාමාජිකයින් තම සාමාජික හැඳුනුම්පත ද රැගෙන පැමිණිය යුතු ය.

නියමිත දිනට අත්තිකාරම් මුදල් නොගෙවූ අය එදින පැමිණීමෙන් වලකින මෙන් දන්වන අතර, 25 දින රාත්‍රී පැමිණීමට නොහැකි එහෙත් චාරිකාව සඳහා සහභාගී වීමට කැමති අය 26 වන දින පෙරවරුවේ දඹුල්ලට පැමිණ චාරිකාවට එක්විය හැකි බව දන්වමි. මේ පිළිබඳ වැඩි විස්තර සඳහා සමාජ සේවා අධ්‍යක්ෂ අමතන්න. (කේ.ජී. කීර්තිරත්න 071 4458144)

මෙම චාරිකාව හුදෙක් ඡායාරූප ගැනීම මෙන් ම සාමාජික සුබසාධනය අරමුණු කොටගත් චාරිකාවක් බව මතකයේ තබාගන්නා ලෙස කරුණාවෙන් දන්වමි.

---

**චාරිකාව සඳහා සහභාගී වන සෑම අයෙකු ම මෙම කොටස සම්පූර්ණ කර භාරදිය යුතු ය.**

**ආසන අංකය** [ ]

නම :...........................................................................................................................

ලිපිනය :...........................................................................................................................

සාමාජික අංකය :.................................................... දුරකතන අංකය :..........................................................

ජා.හැ. අංකය :....................................................

චාරිකාව සඳහා අත්තිකාරම් වශයෙන් රු. ........................ ක මුදලක් ........................ දින භාර දුනිමි.

දිනය :................................................ අත්සන :..........................................................

---

චාරිකාවට සහභාගී වීම පිළිබඳ අපගේ විරුද්ධත්වයක් නොමැත.

.........................................................................................

මව/පියා/භාරකරු අත්සන

# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය

පසුගිය දා තෙවැනි ඇස ප්‍රකාශනය මගින් සංගමයේ ක්‍රියාකාරීත්වය අපහාසයට ලක්කරමින් අනූපම සේනාධීර මහතා විසින් ලියන ලද ලිපියට පිළිතුරු වශයෙන්, සංගමයේ නිල ප්‍රකාශයක් නිකුත් කළ යුතු බව සාමාජික බහුතරයකගේ අදහස විය. ඒ අනුව සම්පාදිත සංගමයේ නිල පිළිතුර අදාළ පාර්ශවය වෙත මේ වන විටත් යොමු කොට ඇති අතර, එය ඔබගේ අවබෝධය පිණිස පිළිසඳරෙහි පළ කරන්නට අපි අදහස් කළෙමු.

## කුමන්ත්‍රණයේ සැබෑ මුහුණුවර හඳුනාගනිමු.

තෙවැනි ඇස නම් ප්‍රකාශනයේ 2009 අප්‍රේල් කලාපයේ 46, 47, සහ 48 පිටුවල ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය සම්බන්ධව පළ කෙරුණු ලිපියේ සඳහන් කරුණු බොහොමයක් සාවද්‍ය සහ ද්වේශ සහගත අවශ්‍යතාවක් පෙරදැරි කොටගෙන ප්‍රබන්ධ කරන ලද්දක් බව පෙනේ. ඒ පිළිබඳ යථාර්ථය ගෙනහැර දැක්වීම මෙම ලිපියේ අරමුණ වෙයි.

දසක හයකට ආසන්න කාලයක් පුරා දේශයේ දූ පුතුනට ඡායාරූප ශිල්පය නොමිලයේ ස්වභාෂාවෙන් ඉගැන්වීමේ වගකීමට උරදුන් සහ අද ද එම කාර්යය ඉටුකරන එක ම ජාතික ආයතනය ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයයි. එය පුණ්‍යායතනයක් මෙන් ම ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ද, ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ ලංකාවේ නියෝජිත ආයතනය වශයෙන් ද ක්‍රියාකරයි. ඊට අමතර ව ඇමරිකානු ඡායාරූප කලා සංගමය ද, ආසියානු ඡායාරූප කලා සම්මේලනය සමග ද සෘජු සම්බන්ධතා පවත්වයි. මෙහි සියලු කටයුතු සාමාජික කැපකිරීම්, ආධාර, දායකත්වයන් මෙන් ම අනුග්‍රහශීලී බාහිර පාර්ශවයන්හි උදව් උපකාර ද මත ක්‍රියාත්මක වේ. එය සමාගම් පනත යටතේ සමාගම් ලේකම්වරයා අනුමත කරන ලද සහ සියලු සාමාජිකත්වය විසින් ඒකමතික ව පිළිගනු ලැබූ ව්‍යවස්ථා මාලාවකට ද, කාර්යබද්ධ චක්‍රලේඛ මාලාවකට ද යටත් ව පාලනය වේ.

ඡායාරූප ශිල්ප අධ්‍යයනය අප සංගමයේ ප්‍රධානතම පරමාර්ථය වන අතර, එම කාර්යාවලිය තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් පදනම් කොටගෙන ක්‍රියාවට නැගේ. ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ අනුමැතිය ලත් ලක්දිව එක ම ඡායාරූප පාඨමාලාව මෙය වේ. එසේ ම ලොව රටවල් 79 ක නිල ප්‍රමිතිය ද, සෙසු රටවල ඉහළ පිළිගැනීමක් ද මෙම පාඨමාලාවට හිමි ව ඇත. මෙය 1961 දී ආරම්භ කරන ලද අතර, ගුණාත්මක බවින් සංවර්ධනය කෙරෙමින් අද දක්වා ම නොමිලයේ පවත්වාගෙන යනු ලබන්නකි. වයස, තරාතිරම, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වෙන යම් භේදයකින් තොර ව ඕනෑ ම කොනෙකුට මෙම පාඨමාලාව හැදෑරීමේ අයිතිය තොවැනි ඇසෙහි හුවා දක්වන්නට උත්සාහ කරන පරිදි මේ දක්වාත් කිසිදු ආකාරයකින් අහෝසි කර හෝ මුදලට හිලව් කර හෝ නැත.

මෙයට අමතර වශයෙන් පාසැල් සිසුනට නොමිලයේ ඡායාරූප ශිල්ප විෂය ඉගැන්වීමේ වැඩපිළිවෙලක් ද ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය විසින් ක්‍රියාවට නගනු ලැබ ඇත. නියමිත ප්‍රමිතියකට යටත් ව සකස් කෙරුණු විෂය නිර්දේශයකට අනුව පාසල් දරුවනට සාමාජිකයින් විසින් නොමිලයේ ඉගැන්වීම ද, වර්ෂාවසානයේ පොදු පරීක්ෂණයක් පවත්වා පිළිගත් සහතික පත්‍රයක් ලබාදීම ද ඊට ඇතුළත් වේ.

ලක්දිව ඡායාරූප කලාවේදීන්ගේ සුබසාධනය උදෙසා සංගමයේ මාර්ගෝපදේශකත්වයෙන් ක්‍රියාත්මක කෙරෙන ලංකා ප්‍රභාලේඛිකා සංසදය ද, ජාත්‍යන්තර කාන්තා දිනය අළලා ඡායාරූප ශිල්පීන්ගේ නිර්මාණ ප්‍රදර්ශනයක් ද, සමාජ සුබසාධන ව්‍යාපෘති මාලාවක් ද වාර්ෂික ව ක්‍රියාත්මක කරයි. මෙම කාන්තා බලමුළුව මෙන් ම ඉහත සඳහන් කළ පාසල් වැඩසටහන් ව්‍යාපෘතිය ද 1975/76 වකවානුවේ දිවංගත විල්සන් හැගොඩ සූරීන්ගේ මගපෙන්වීම පරිදි ආරම්භ කරන ලදුව, පසු කලෙක අක්‍රීය ව තිබී පසුගිය දෙවසර තුළ යළි පනගන්වන ලද කාර්යයක් බව ද සඳහන් කළ මනා ය.

සංගමයේ අධ්‍යාපනය ලබා ක්ෂේත්‍රයට පිවිසෙන විද්‍යාර්ථීන්ට ගැඹුරින් විෂය ඥානය ලබාදීම හා ප්‍රායෝගික අත්දැකීම් එක්රැස් කරදීම ද, සංගමයට බාහිරව සිටින ශාස්ත්‍රකාමී සැමට සත්කාරයක් සැලසීම ද අරමුණු කොටගෙන වෘත්තීය කණ්ඩායම පිහිටුවනු ලැබූයේ මීට දෙවසරකට පෙර දී ය. එය ව්‍යාපෘතියක් වන අතර, එහි වැඩසටහන් සංවිධානය පිණිස අවශ්‍ය පිරිවැය ඊට සහභාගී වන විද්‍යාර්ථීන්ගේ දායකත්වයෙන් සපුරාගනු ලබයි. ඒ අනුව වසරකට වැඩසටහන් 03 ක් හෝ 04 ක් මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කෙරේ. එය සංගමිකයනට ද, විෂය ලැදි අන් ඕනෑ ම අයෙකුට ද සහභාගී විය හැකි ව්‍යාපෘතියකි. මේ දක්වා ඉන් ක්‍රියාත්මක කෙරුණු වැඩසටහන්, සහභාගී වූවන්ගේ ඉමහත් පැසසුමට පාත්‍ර වී ඇත. ලක්දිව කිසි දාක සිදු නොවුණු විරල ගණයේ අත්දැකීම් ඡායාරූප ක්ෂේත්‍රයට එකතු කළ අවස්ථාවක් බව ද සහභාගී වූවෝ පවසති.

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය සිය අධ්‍යාපන, වෘත්තීය, සමාජ සේවා, ප්‍රදර්ශන, ප්‍රකාශන, පාසල්, කාන්තා යන අංශවල සමාජමය සත්කාර වෙනුවෙන් මේ දක්වා සංවිධානය කළ පංති, සම්මන්ත්‍රණ, වැඩමුළු, චාරිකා, සැසිවාර සංඛ්‍යාව දහස ඉක්මවයි. එසේ ම ජාතික වශයෙන් විවිධ අමාත්‍යාංශ, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා විෂය බද්ධ

උපදේශනය, සංවිධාවන දායකත්වය, කාර්ය සහාය සැපයීම ද ජාතික ආයතනයක් වශයෙන් එහි උසස් පිළිගැනීම සලකුණු කරයි. මේ සියල්ලක් ම දැනුදු ක්‍රියාත්මක වෙමින් පවතිනුයේ එහි ව්‍යවස්ථාව අබමල් රේණුවක තරමින් හෝ උල්ලංඝනය නොවෙමින් බව ද වගකීමෙන් සඳහන් කළ යුත්තකි.

සංගමයේ දැවැන්ත සමාජ සත්කාර්යයන් වසර 60 කට ආසන්න කාලයක් පුරා සිදු වූයේ අපමණ අසීරුතා මධ්‍යයේ ය. එහි දී පැවති ප්‍රධාන තම ගැටලුව වූයේ සංගමය සඳහා මූලස්ථානයක් නොතිබීමයි. මේ පිළිබඳ සාවධානව සලකා බැලූ සාමාජික දෙපළක් වන චින්තක තේනුවර මහතා සහ අමාලි පූර්ණිමා තේනුවර මහත්මිය තම පවුලේ දේපළක් ඒ සඳහා පිරිනමනු ලැබූයේ අතිශය සද්භාවයෙන් යුක්ත ව ය. සංගමයේ කටයුතු සඳහා මූලස්ථානයක් ආරම්භ වූයේ ඔවුන්ගේ එකී ශ්‍රේෂ්ඨ දායකත්වය හේතුවෙනි. වසර 06 කට ආසන්න කාලයක් ගෘහස්ථ භාවිතයකින් තොර ව පැවති එම නිවහන අත්‍යවශ්‍ය අලුත්වැඩියාවන්ගෙන් පසු සංගමයේ පරිහරණයට නිල වශයෙන් භාවිතයට ගනු ලැබූයේ 2009 පෙබරවාරි මස පළමුවැනිදා ය.

මෙම මූලස්ථානය "ජාතික ඡායාරූප ශිල්ප මධ්‍යස්ථානය" වශයෙන් නම්කරනු ලැබූයේ සියලු සාමාජික භවතුන්ගේ ඒකඟතාව සහ ආශිර්වාදය මධ්‍යයේ ය. ව්‍යවස්ථාවට හා අනුගත චක්‍රලේඛයකට යටත් ව එහි ක්‍රියාකාරීත්වය පණ පොවන ලද අතර, මධ්‍යස්ථානයේ දී සංගමයේ කටයුතු මෙන් ම සාමාජික සුබසාධනය අරමුණු කොටගත් කාර්යයන් ක්‍රියාත්මක කරලීමට ද මහා සභාවේ දී තීරණය විය. ඒ අනුව අධ්‍යාපන, ප්‍රකාශන, පාසල් වැඩසටහන්, කාන්තා වැඩසටහන්, වෘත්තීය කාර්යයන්, පරිපාලන කටයුතු මෙන් ම සාමාජික සුබසාධන වැඩසටහන් ද මේ දක්වා එහි ක්‍රියාත්මක කොට ඇත.

ඊට අමතර ව මධ්‍යස්ථානය කඩත්තු කිරීම උදෙසා මහා සභාවේ දී ඇතිකරගනු ලැබූ එකඟතාව පරිදි විවිධ විෂයන් සඳහා සාමාජිකයින් විසින් සැසිවාර හා පංති ද ආරම්භ කොට ඇත. ඒ යටතේ ඡායාරූප, සිනමා, වීඩියෝ, චිත්‍ර, ප්‍රතිබිම්බ කලා, සංස්කෘතික අධ්‍යයන ආදී විවිධ වැඩසටහන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත් ව සාමාජිකයින් විසින් එම ස්ථානයේ පවත්වාගෙන යනු ලබයි. ඒවා සංගමය මගින් පවත්වන වැඩසටහන් නොවන අතර, සංගමය මගින් හෝ ඡායාරූප ශිල්ප මධ්‍යස්ථානය නමින් හෝ සංගමයේ කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ හෝ කාර්යයක් නොවන බව වගකීමෙන් ප්‍රකාශ කළ යුතු ව ඇත. කලකට ඉහත නිතිපතා මංපහරන්නන්ගේ, සොරුන්ගේ ආගිය තැනක් බවට පත්ව තිබූ සංගම් මූලස්ථානය මනා සේ නඩත්තු කිරීම ද එහි විදුලි, දුරකථන, ජල බිල්පත් ගෙවීම ද, එලෙස සාමාජික වැඩසටහන්වලින් ඒ අය පරිත්‍යාග ලෙස ලබාදෙන මුදලින් සිදුකරනු ලබයි. මෙම තත්වය අප්‍රකට හෝ රහසේ සිදුකෙරෙන හෝ සිදුකිරීමට සැලසුම් කරන ලද්දක් නොවන අතර, එය පෙබරවාරි මස පැවැත්වූ මහා සභාවේ දී ඇතිකරගනු ලැබූ එකඟතාව පරිදි සිදුවන්නා වූ කාර්යයක් ද වේ.

තෙවැනි ඇස සඟරාවේ මේ ගැන අදහස් ලබාගත්තේ යැයි කියන හිටපු සභාපතිවරුන් දෙපළක් සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු ද එම ලිපියේ ලේඛකයා වන අනුපම සේනාධීර මහතා ද එම රැස්වීමට නොපැමිණීම වෙනම ම කරුණකි. එහෙත් අදාළ කරුණු ගැන නොදැනුවත්ව අදහස් දක්වන්නට යාම ඒ අයගේ අඥාන බව ප්‍රදර්ශනය කිරීමකි. එසේ ම එම ලිපියේ පළවන ආකාරයට සංගමයේ වර්තමාන කාර්යයන් හෙළාදකින හිටපු විධායක අධ්‍යක්ෂ ඩින්ටන් ජයසූරිය මහතා ද තමා මුලාවට පත්කර වචන සොරකමක් සිදුකිරීමෙන් සේනාධීර මහතා විසින් කරන ලද අවක්‍රියාව ඔහු ඉදිරිපිට දී ජුනි මස 21 වන දින ප්‍රසිද්ධියේ හෙළාදකිනු ලැබීය. සංගමයේ අධ්‍යක්ෂවරුන් ලෙස ප්‍රකාශ ලබාදුන් බව සඳහන් කර ඇති ප්‍රියන්ත අමරසිංහ මහතා ද ශාන්තිලාල් ප්‍රනාන්දු මහතා ද තම ප්‍රකාශ විකෘති සහගත ලෙස සංගමයට ද්‍රෝහී අරුත් මතුකෙරෙන ආකාරයෙන් පළකළ බව පවසති. සංගමයට ස්ථානය ලබාදුන් චින්තක තේනුවර මහතා සමග කළ කතාබහෙන් තෝරාගත් කොටස් කිහිපයක් සංස්කරණය කර පෙන්වීමේ අරමුණ, "සංගමය ගිවිසුම් කඩකර තිබේ ය. සංගමයට ඕනෑ හැටියට නටන්න මම ඉඩ තබන්නේ නැත. සංගමයෙන් කුලී අයකරන්නට මා අදහස් කරනවාය." ආදී වශයෙන් ඒ මහතා සහ සංගමය අතර, පවත්නා සුහදශීලී බව බිඳදැමීම ය. ඒ හරහා මෙම ස්ථානය සංගමයට අහිමි කර එහි ක්‍රියාකාරීත්වය මැඩපැවැත්වීම ය.

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයට පහර දෙන්නට සේනාධීර මහතාට ඇති රුදාව ඔහුගේ සඟරාවේ 04 වන පිටුවෙහි දී එළියට පැන ඇත. තෙවැනි ඇස සඟරාවෙන් නැවත වැඩමුළු පවත්වන ලෙස පාඨක දෙපොළකගේ නමින් එහි කෙටි ලිපි පළකොට තිබේ. කලකට ප්‍රථම බංකොලොත් වූ වැඩමුළු ව්‍යාපාරය අර්ථවත් සහ ඔරොත්තු දෙන පරිමාණයේ ක්‍රියාවක් ලෙස යළි සමාජගත වූයේ වෘත්තීය කණ්ඩායමේ ක්‍රියාකාරීත්වය හේතුවෙනි. වැඩමුළු ව්‍යාපාරිකයන් මේ කාර්යයෙන් කුළප්පු වීම විමතියට කරුණක් නොවේ. සංගමයේ වැඩමුළුවල සාර්ථකභාවය එම සඟරාවේ ම 76 පිටුවේ සඳහන් වන අතර, එම කාර්යයේ කර්තෘත්වය හොබවන වෘත්තීය කණ්ඩායම පතුරුගහන්නේ 48 පිටුවේ ය. මේ දිව දෙකේ ජනමාධ්‍ය කලාව හරි අපූරු ය.

සංගමයේ මූලස්ථානය, සතියේ දිනවල දහවල් කාලයේ ගණිකා මඩමක් බවට පත්වේ යැයි කටකතාවක් පතුරවන්නට වෑයම් කළ තැනැත්තෙකු ගැන ද අපට දැනගන්නට ලැබිණි. "එවන් දේ සංගමයේ මූලස්ථානයෙහි සිදුවන්නේ නම්

එයට ඔබේ ප්‍රතිචාරය කුමක් දැයි" කිසිවෙකුගෙන් විමසා, ප්‍රශ්නය නොලියා පිළිතුර පමණක් තම ලිපියට ඇතුළත් කරන අයෙකු වේ නම් ඔහු එමගින් අරමුණු කරන්නේ කුමක් දැයි යන්න හොඳ හැටි පැහැදිලි ය.

පසුගිය ජූනි මාසයේ දෙවන සතියේ අපට දැකගන්නට ලැබුණු කරුණක් වූයේ සංගමයේ මහා සභාව අරමුණු කොටගෙන එහි විධායක අධ්‍යක්ෂවරයා විසින් යවන ලද ලිපිය වංචනික ලෙස සංස්කරණය කොට තෙවැනි ඇස ලිපි-යේ ඕෆ්සෙට් මුද්‍රණ පිටපතක් ද සමග සංගමයේ ක්‍රියාකාරීන් වෙත යවන ලද බවයි. "සංගමයේ වර්තමාන (2008/2009 අධ්‍යක්ෂ මණ්ඩලය) නියමුවන්ගේ ව්‍යවස්ථා විරෝධී, විනය විරෝධී, ද්‍රෝහී ක්‍රියා පිළිවෙත හෙළිදරව් කිරීමට කාලය පැමිණ ඇතැයි කියමින්" අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහි ව සාමාජිකත්වය පෙළගැන්වීම එහි අරමුණ වී තිබිණි.

ඊට සමගාමී ව අප වෙත වාර්තා වූ තවත් කරුණක් වූයේ, උදෑසන දිවා කාලයේ තරුණ යුවළක් යොදවා සංගමයේ මූලස්ථානය වෙත ගමන් කරන සහ/හෝ ඉන් බැහැරව එන දර්ශන වීඩියෝගත කිරීමේ කුමන්ත්‍රණයකි. එය තේනුවර යුවළගේ මැණියන් වෙත යැවීම ද, සෙසු අයට විද්‍යුත් තැපැල් මගින් යොමු කිරීම ද එම කුමන්ත්‍රණයේ ඊළඟ ඉදිරි පියවරක් විය. එමගින් දසක හයක් පුරා සම්භාවනීය චරිත ලක්ෂණ සහිත ව පවත්නා සංගමයේ ප්‍රතිරූපය කෙලෙසීම ද, අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු ක්‍රියාකාරී සාමාජිකත්වයට පරිභව කිරීම ද, ස්ථානය සංගමයට අහිමි කරලීම ද අරමුණු කෙරිණි.

සංගම් මූලස්ථාන භාර නිලධාරීන් ලෙස එහි නේවාසික ව සිටින සාමාජික මහතෙකුට "උඹලාට අද හෙට පාරට බහින්නට සිදුවනු ඇතැයි" එක්තරා ඡායාරූප සංගමයක් නියෝජනය කරන භවතෙකු විසින් කරන ලද ප්‍රකාශය මේ සියලු කූට සැලසුම් අනපේක්ෂිත ලෙස ප්‍රකාශයට පත්වීමකි.

අද දක්වා මත් ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ යාවජීව සාමාජිකයෙකු ලෙසින් සිටින අනුපම සේනාධීර මහතාට සංගමය පිළිබඳ කිසියම් හෝ ආකාරයකට ගැටලුවක් පැවතිණි නම් එය සංගමය තුළ ම ප්‍රශ්න කිරීමට, විමසීමට ඕනෑ තරම් ඉඩකඩ තිබිණි. ඔහු මෙම ලිපියෙන් සංගමයට කර ඇතිතේ සේවයක් නම් ඒ බව පළමුවෙන් ම පිළිගෙන ඊට කෘතඥතාව පළ කරනු ඇත්තේ ද සංගමයේ ස්පන්දනය හඳුනන ක්‍රියාකාරී සාමාජිකත්වයයි.

සංගමයේ ප්‍රමුඛතම වගකීම වූ ඡායාරූප පංති පැවැත්වීමේ කාර්යය, 2008 වසර මුල දී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් බාහිර කටයුතු සඳහා පාසල් ලබා නොදීමේ තීරණය ගත් අවස්ථාවේ බිඳ වැටුණු අයුරු අපට මතක ය. පංතියක්, රැස්වීමක් පවත්වන්නට තැනක් නොමැති ව අසරණ වූ මොහොතේ ගැටලුව විසඳාගනු පිණිස අනුපම සේනාධීර මහතාගේ හෝ ඔහුගේ මත පිළිගන්නා කිසිවෙකු හෝ ඉදිරිපත් වූයේ නැත. එවන් ගැටලු මධ්‍යයේ ඉමහත් පරිශ්‍රමයක් දරා සංගමයේ කටයුතු ක්‍රමවත් ව සැලසුම් කිරීමේ දී ඒ ගැන විවිධ ප්‍රකාශ මගින් ආක්‍රෝශ පරිභව කරන්නට යම් කෙනෙක් ඉදිරිපත් වන්නේ නම් ඔහුගේ සද්භාවයේ තරම වටහාගැන්ම ඔබට අපහසු නොවනු ඇත.

ලක්දිව අනභිභවනීය සමාජ භූමිකාවකට හිමිකම් කියන ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයට එරෙහිව දියත් වන මේ කුමන්ත්‍රණය වටහාගැන්ම මෙරට ප්‍රතිබිම්බ කලා ලෝලී සැමට අදාළ වන්නකි. මෙවැන්නක් නිකරුණේ සිදු නොවන්නේ ය. වෛර වැයමින් යම් යම් අය හමුවීමට යාමට, දුරකථන සංවාද පැවැත්වීමට, කාලය, ශ්‍රමය, ධනය විය පැහැදම් කරන්නට කෙනෙක් ඉදිරිපත් වන්නේ නිකන් ම නොවේ. ලිපි ශීර්ෂ පරිලෝකනය කර තම වියදමින් තැපැල් කරන්නට, ඕෆ්සෙට් ක්‍රමයට ලිපි මුද්‍රණය කරන්නට, අමාරුවෙන් තරුණ යුවළක් එකග කරවාගෙන ගණිකා සමාගමයක් ලෙස රඟපාවන්නට, එය වෙහෙස මහන්සි වී වීඩියෝගත කරන්නට, විද්‍යුත් තැපැල් මගින් තොරතුරු සම්ප්‍රේෂණය කරන්නට කෙනෙක් ඉදිරිපත් වන්නේ කරන්නට වැඩක් නැතුවාට ද නොවේ.

මේ ඇගේ අමාරුවට ප්‍රධාන හේතුව වන්නේ වසරක් පාසා දෙසීයකට නොඅඩු පිරිසක් ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය ඔස්සේ මෙරට ඡායාරූප කලා ක්ෂේත්‍රයට පා තැබීම ය. කොහොමින් හෝ සංගමය භූමිදාන කරගත හොත් මෙම විද්‍යාර්ථීන් දෙසීය උපයෝගී කොටගෙන මුදලට ඡායාරූප ශිල්පය විකුණන පංති පැවැත්වීමෙන් ද, සම්මන්ත්‍රණ, වැඩමුළු සංවිධානය කිරීමෙන් ද, ප්‍රකාශන අලෙවි කිරීමෙන් ද, කැමරා ආම්පන්න පිටරටින් ගෙන්වා දීමෙන් ද බඩ වියත රැකගන්නට කිහිප දෙනෙකුට අවස්ථාව උදාවනු ඇත. එසේ ම මේ තාක් කලක් කොයි යම් හෝ ආකාරයකින් අත්පත් කරගන්නට නොහැකි වූ පිළිගැනීමක්, වීරත්වයක් ඒ ඔස්සේ ලබාගත හැකි වනු ඇත.

කුමන්ත්‍රණය සැබෑ වශයෙන් ම ඇත්තේ කොතැන ද?. කුමන්ත්‍රණය කවරක් ද?. අපි එය මෙලෙස අනාවරණය කරමු. කුමන්ත්‍රණකරුවෝ කවරහු ද?. එය ඔවුන් විසින් ම ස්වයං අනාවරණය කරනු ඇත.

**ගරු අධ්‍යක්ෂ මණ්ඩලය (2009/10)**

**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය.**

## ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය.
## The National Photographic Art Society of Sri Lanka
## ඡායාරූප පාඨමාලා විද්‍යාර්ථීන් සඳහා වන
## මාසික ඡායාරූප තරග නිර්ණායක

### අරමුණ

සංගමයේ ඡායාරූප පංතිවල අධ්‍යාපනය ලබන විද්‍යාර්ථීන්ගේ නිර්මාණාත්මක හැකියාව සහ රසවින්දනය වැඩිදියුණු කරලීම අරබයා මාසික ව සංවිධානය කෙරේ. ජාතික හා ජාත්‍යන්තර තරග සහ ප්‍රදර්ශන සඳහා නිර්මාණකරුවන් දිරිගැන්වීම ද මෙමගින් අපේක්ෂිත ය.

### තේමාව

අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය පරිදි විශේෂිත තේමාවක් තෝරාගන්නා අවස්ථා හැර, අන් සෑම ඡායාරූප තරගයක් ම විවෘත තේමා යටතේ පැවැත්වේ.

### නිර්මාණ ඉදිරිපත් කිරිම

සංගමයේ ඡායාරූප පංතිවල අධ්‍යාපනය ලබන අයට පමණක් සීමා වේ.

### ඡායාරූප ඉදිරිපත් කිරීමේ නිර්ණායක

- මීට පෙරාතුව වෙනත් ඡායාරූප දැක්මක ප්‍රදර්ශිත හෝ කලින් මාසික තරගවලට ඉදිරිපත් කළ ඡායාරූප මේ සඳහා භාරනොගැනේ.
- එක් අයෙකුට අභිමත නිර්මාණ සංඛ්‍යාවක් ඉදිරිපත් කළ හැකි ය.
- අධ්‍යයන වර්ෂයේ පළමු මාසික තරග 02 පහත සඳහන් අංශ යටතේ පැවැත්වේ.
  ප්‍රථම වසර වර්ණ හෝ ඒකවර්ණ - විශාලත්වය 4, ං 6, සිට ඉහළට.
  දෙවන වසර ඒකවර්ණ
  දෙවන වසර වර්ණ විශාලත්වය 5, ං 7, සිට ඉහළ ට.
  තෙවන වසර ඒකවර්ණ
  තෙවන වසර වර්ණ

- අධ්‍යයන වර්ෂයේ තුන්වන මාසික තරගයේ පටන් අවසානය දක්වා පහත සඳහන් අංශ යටතේ පැවැත්වේ.
  ප්‍රථම වසර ඒකවර්ණ
  ප්‍රථම වසර වර්ණ
  දෙවන වසර ඒකවර්ණ විශාලත්වය 5, ං 7, සිට ඉහළට
  දෙවන වසර වර්ණ
  තෙවන වසර ඒකවර්ණ
  තෙවන වසර වර්ණ

### කෘති ඇගයීම

අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ඇතිව මාසික ඡායාරූප තරග සංවිධායක විසින් පත්කරනු ලබන තේරීම් කමිටුවක පොදු එකඟතාව මත කෘති තෝරාගත යුතු ය. කෘති ඇගයීමේ නිර්ණායක තරග සංවිධායකවරයාගේ අභිමතය හා තේරීම් කමිටුවේ එකඟතාව පරිදි සිදුකළ හැකි නමුදු, ඡායාරූප සම්බන්ධ විවෘත සංවාදයේ දී ඒ පිළිබඳ කරුණු සභාගත කළ යුතු ය.

නිර්මාණකරුවන් දිරිගැන්වීම සඳහා සෑම තරග අංශයක ම ප්‍රමුඛතා ලබන ජයග්‍රාහකයාට කිසියම් හෝ තිළිණයක් ප්‍රදානය කළ යුතු ය. එක් අධ්‍යයන වර්ෂයක් තුළ තරගවල ඉහළ ම ප්‍රමුඛතා ලබාගන්නා නිර්මාණකරුවාට වර්ෂාවසානයේ ඒ සඳහා නියමිත ශූරතා පළිහ පිරිනැමීමට කටයුතු සංවිධානය කිරීම මාසික තරග සංවිධායකවරයාගේ වගකීම වේ.

### මාසික තරග සංවිධායක තනතුර

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව සංගමයේ අධ්‍යයන අධ්‍යක්ෂවරයා විසින් කිසියම් නිල වර්ෂයකට හෝ අධ්‍යයන වර්ෂයකට අදාළ ව මාසික තරග සංවිධායක පත්කරනු ලබයි. එසේ පත්කරනු ලැබූ තරග සංවිධායකවරයා හෝ සංවිධායකවරිය අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිවයුතු වන්නේ ය. පත්කරගනු ලැබූ මාසික තරග සංවිධායකවරයා හෝ සංවිධායකවරිගේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් නොවන්නේ නම්, ඕනෑ ම මොහොතක එකී තනතුරට අනෙකෙකු පත් කළ හැකි ය.

# මධ්‍යස්ථානයේ වැඩසටහන්

## උදේනිගේ ප්‍රතිබිම්බ කලා පාඨමාලා

ජ්‍යෙෂ්ඨ සාමාජික උදේනි අල්විස් මෙහෙයවන පාඨමාලා තුනක් "අපේ ගෙදර" දී සංවිධානය කෙරෙනවා. දස දෙනෙකුගේ කණ්ඩායම් වශයෙන් මෙම පාඨමාලා ඔබට පහසු කාලසටහනක් යටතේ ඉදිරිපත් කෙරෙන බැව් ඔහු පවසනවා. අහන්න, වැඩි විස්තර උදේනිගෙන් (0777 751819)

**ව්‍යවහාරික වීඩියෝ මාධ්‍ය පිළිසඳර**

(ඡායාරූප ශිල්පය දන්නා ඇත්තන්ට වීඩියෝ මාධ්‍ය ඥානය ලබාදීමට සැලසුම් කරන ලද්දකි.)

**නිශ්චල ඡායාරූපකරණයේ මූලධර්ම**

(ඔබට නොවේ. පුංචි කැමරාවකින් අහුවෙච්චි හැටියට පොටෝ ගන්නා ඔබේ හිතවතුන්ගේ මූලික විෂය ඥානය සඳහා ඉදිරිපත් කෙරෙන්නක්.)

**ග්‍රාපීය සැලසුම්කරණ වැඩමුළුව**

(පරිගණක භාවිතයෙන් අර්ථවත්, නිර්මාණාත්මක ක්‍රියාකාරකම් තමන්ට ම කරගන්නට මගපෙන්වීමක්.)

පාඨමාලා අන්තර්ගතය සඳහා ලංකා කැමරා 2008 වස්සාන කලාපයේ 64 වන පිටුව පෙරළන්න. මෙම පාඨමාලා 03 ම ලබන මස ඇරඹීමට නියමිතයි.

## සිත්තරුන්ට ඇරයුමක්.

චිත්‍ර කලාවට ලැදි සැම වෙනුවෙන් ශාස්ත්‍රවේදී ප්‍රියන්ත අබේසුන්දර මෙහෙයවන චිත්‍ර පංතිය "අපේ ගෙදර" දී ඉරිදා දිනවල පෙ.ව. 9.00 ට.

O/L විභාගයට චිත්‍ර ඉගෙන ගන්නා අයට

A/L චිත්‍රවලින් සමත් වීමට අදහස් කරන අයට

චිත්‍ර කලාවට පෙම් කරන කොයි කාටත්

තෙලිතුඩින් රූප මවන්නට කැමති අපේ සාමාජික-යන්ට මේ පංතිය විවෘතයි. සේරම විස්තර ප්‍රියන්තගෙන් (0777 416669) අහන්න.

## කැලුම්ගේ ප්‍රතිබිම්බ කලා පංතිය

කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලාවේ "ප්‍රතිබිම්බ කලා" විෂය සඳහා පංතියක් "අපේ ගෙදර" පැවැත්වෙනවා. ඡායාරූප, සිනමා, රූපවාහිනී ක්ෂේත්‍රයෙන් බාහිර උපාධි හදාරන්නන්ට අපූරු විෂයක් වගේ ම රූප මාධ්‍යයට ලැදි කොයි කාටත් විශ්වවිද්‍යාල මට්ටමේ නැණ නුවන එක්රැස් කරගැනීමේ ආරාධනයක් තමයි මේ. අපේ සාමාජික කැලුම් කුමාර මොහොට්ටිගේ (077 3985630) වෙතින් මේ ගැන විස්තර දැනගත හැකියි.

## මධුරංගගේ දෘශ්‍ය කලා පාඨමාලාව

කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා නිර්දේශ අනුව "දෘශ්‍ය කලා" විෂය සඳහා අපේ සාමාජික මධුරංග අලුත්වත්තගේ දේශන මාලාව අපේ ගෙදර දී පැවැත්වේ. වැඩි විස්තර සඳහා මධුරංග 0777 133141 අමතන්න.

## ඩිජිටල් ලෝකයට පාතබමු.

එන්න එන්නම පටල පටි කැමරා භාවිතය ඈත් වෙනවා. කැමැත්තෙන් හෝ අකමැත්තෙන් ඡායාරූප ශිල්පීන් සැමදෙනාට ම තවදුරටත් මේ මාධ්‍යයේ රැඳෙන්නට අවශ්‍ය නම් ඩිජිටල් තාක්ෂණය හා අනුගත වීමට සිදුවෙලා. ඒ සඳහා මගපෙන්වන පැය 30 අර්ධකාලීන පාඨමාලාවක් සාමාජික උපුල් ජයන්ත රණේපුර විසින් අලුතෙන් පටන් ගන්නවා. වැඩි විස්තර උපුල්ගෙන් 071 6005600 විමසන්න

## රූ රස කතිකාව

**රූප මාධ්‍යයේ ප්‍රබුද්ධත්වය සොයා යන සංවාදාත්මක සංකථනය**

රූ රස කතිකාව මාසික පිළිසඳරෙහි පළමු පියවර වූයේ අශෝක හඳගමයන්ගේ "අක්ෂරය" තිරගත කිරීම සහ ඔහුගේ ප්‍රධානත්වයෙන් පැවත්වූ ඒ පිළිබඳ සංකථනයයි. එහි දෙවන පියවර ලෙස ප්‍රසන්න ජයකොඩි අධ්‍යක්ෂවරයාගේ "සංකාරා" තිරගත කොට, නිර්මාණකරුවාගේ සහ ප්‍රධාන නළුවාගේ ප්‍රධානත්වයෙන් එහි සංවාදය පැවැත්විණි.

**රූ රස කතිකාවේ තෙවැනි පියවර**

| | |
|---|---|
| නිමිත්ත | : කේ.ඒ. විජේරත්නගේ "මධුසමය" |
| දිනය | : අගෝස්තු 09 ඉරු දින |
| වේලාව | : පුරුදු පරිදි උදෑසන නවය |
| ස්ථානය | : අපේ ගෙදර (සංගම් මූලස්ථානය) අංක.56/2, කඩවත පාර, කළුබෝවිල, දෙහිවල. |
| ආරාධනය | : සාමාජික ඔබට සහෝදරත්වයෙන් සහ ඩිප්ලෝමා පංතියේ විද්‍යාර්ථීනට අනිවාර්යයෙන්. |

## අපේ ගෙදරට ලැබුණු උදව් පදව්

සංගම් මූලස්ථානයේ සිදුකෙරෙමින් පවතින ශාස්ත්‍රීය, සමාජ හා සංස්කෘතික සේවාවන් දිරිමත් කිරීම සඳහා පසුගිය කලාපයෙන් කරන ලද ඉල්ලීම අනුව ලැබුණු පරිත්‍යාග මතු සඳහන් ය. පරිත්‍යාගශීලී සමාජික භවතුන්ට ස්තුතිය පිරිනමමු.

නන්දනී හෙට්ටිආරච්චි මෙණෙවිය - ප්ලාස්ටික් කේතලය

වෛද්‍ය දිලන්ත ධර්මගුණවර්ධන මහතා - කලුසුදු විස්තාරකය

චායා අබේවර්ධන මහතා - විස්තාරක කාචය

## අතුල රණරාජගේ "Single Light"



ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සාමාජිකයෙකු වන අතුල රණරාජා මහතාගේ දෙවැනි ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනය "Single Light" නමින් මැයි මස 29, 30, 31 යන දිනයන්හි හි උතුරු පළාත් ආණ්ඩුකාර ඩික්සන් දැල බණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ ලයනල් වෙන්ඩ්ට් කලා ගාරයේ දී පැවැත්විණ.

මෙම ඡායාරූපවල විශේෂත්වය වන්නේ ඡායාරූප ගැනීමේ දී එක් ආලෝක ප්‍රභවයකට සීමා වීමයි. එමෙන් ම පරිගණක ආශ්‍රයෙන් කරන ලද රූප සංස්කරණයක් ද දක්නට ලැබුණි. ඒ පිළිබඳ තොරතුරු සඳහා www.athu-laranaraja.com වෙබ් අඩවියට පිවිසෙන්න.

## චින්තකට, පූර්ණිමාට ගරු සාමාජිකත්ව පිරිනැමේ.

සංගමයේ කාර්යයන් උදෙසා තම නිවසක් පරිත්‍යාග කළ චින්තක/පූර්ණිමා දෙපළට, පසුගිය අර්ධ වාර්ෂික මහා සභාවේ ඉදිරිපත් වූ යෝජනාව සැලකිල්ලට ගනිමින් ගරු සාමාජිකත්ව පිරිනැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත.

# 2009/2010 අනුකමිටු නාමලේඛනය

මෙම නිල වර්ෂය සඳහා ඒ ඒ අධ්‍යක්ෂවරයා යටතේ ක්‍රියාත්මක වන අනුකමිටු සහ ඒවායේ සාමාජික මහත්ම මහත්මීන් පහත දැක්වේ. මෙය 2009.07.21 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමත කරන ලදී.

**සභාපති**

**මාධ්‍ය ප්‍රචාරණ අනුකමිටුව**

කංචන මාරසිංහ, රවීන්ද්‍ර පුෂ්පකුමාර, සුදම් ගුණසිංහ, කමල් කාරියවසම්, ආසිරි ද සොයිසා, එච්.ඩී. ප්‍රේමනායක.

**සාමාජික අත්පොත් අනුකමිටුව**

විජය බස්නායක, තිලක වෙරළුපිටිය, රවීන්ද්‍ර ලාල්

**ඡායාරූප සම්මාන පිළිබඳ නිර්දේශ අනුකමිටුව**

කංචන මාරසිංහ, තිලක වෙරළුපිටිය, සේනාරත්න බණ්ඩාර.

**මුදල් අධ්‍යක්ෂ**

**මූල්‍ය කළමනාකරණ අනුකමිටුව**

අමරා වීරසේකර, තිනේෂා එදිරිසිංහ, චම්පා කුරුප්පු, අමාලි නානායක්කාර

**මූල්‍ය ප්‍රවර්ධන අනුකමිටුව**

අජිත් සිරිවර්ධන, කීර්ති නිශ්ශංක, මංගල එදිරිසිංහ, ප්‍රියන්ත අමරසිංහ

**ලේඛකාධිකාරී**

**බඳවාගැනීම් අනුකමිටුව**

ප්‍රියන්ත අමරසිංහ, එල්.බී.එස්.එස්. බාලසූරිය, චායා අබේවර්ධන, ගාමිණී ආර්. ෆොන්සේකා, ජේ.පී. ද අල්විස්, අමරා වීරසේකර

**වෙබ් අඩවි අනුකමිටුව**

උපුල් රණේපුර, පණ්ඩුක ද සිල්වා, ප්‍රභාත් චතුරංග ද සිල්වා.

**අධ්‍යාපන අධ්‍යක්ෂ**

සභාපති, ලේඛකාධිකාරී, ඩිප්ලෝමා නිබන්ධන සම්බන්ධීකාරක, පංතිභාර ගුරුවරුන් 03, විජය බස්නායක.

**අධ්‍යාපන සේවා අනුකමිටුව**

පංති භාර ආචාර්යවරු තිදෙනා, හසිත ලියනගේ, එච්.එම්.ආර්. පෙරේරා

**අධ්‍යාපන වැඩමුළු අනුකමිටුව**

චන්ද්‍රසේන පෙරේරා, උපනන්ද සෙනෙවිරත්න, ඉන්ද්‍රනාථ තේනුවර, ලක්ෂ්මී තිලකරත්න

**මාසික තරග අනුකමිටුව**

තිනේෂා එදිරිසිංහ, චම්පා කුරුප්පු, අමාලි නානායක්කාර.

**ඩිප්ලෝමා ව්‍යාපෘති අනුකමිටුව**

ප්‍රදීප් වෙදමෙස්ත්‍රිගේ, අනෝජා පෙරේරා, පැතුම් රංගන, ප්‍රශාන් කුමාර ජයසිංහ, ඩබ්.අයි.ඩී. කුමාර ද සිල්වා, පුබුදු සම්පත්, ඉන්දික රත්නායක, එල්.එන්.ජී.සී. තිලන්ත කුමාර,අසන්ත ඉන්ද්‍රජිත්.

**සංවර්ධන සහ ප්‍රවර්ධන අධ්‍යක්ෂ**

**මධ්‍යස්ථාන කළමනාකරණ අනුකමිටුව**

ඉන්දික රත්නායක, සමන් ලෙනින්.

**සංවර්ධන සහ ප්‍රවර්ධන අනුකමිටුව**

ඉන්දික හෙට්ටිආරච්චි, ජීවනී ශ්‍රියා ප්‍රියන්ති, රුවිනි දිසානායක, අමාලි නානායක්කාර

**වෘත්තීය කණ්ඩායම**

උදේනි අල්විස්, සම්පත් පීරිස්, සමන්ත සේනක බණ්ඩාර, චමින්ද උපසේන

**ප්‍රදර්ශන අධ්‍යක්ෂ**

**ප්‍රදර්ශන අනුකමිටුව**

සමන්ත සේනක බණ්ඩාර, ප්‍රියන්ත අබේසුන්දර, කුමාර කරව්දෙණිය, චමින්ද උපසේන.

**ප්‍රකාශන අධ්‍යක්ෂ**

**ලංකා කැමරා අනුකමිටුව**

රවීන්ද්‍ර පුෂ්පකුමාර, ප්‍රභාත් චතුරංග ද සිල්වා, විමල් ප්‍රියශාන්ත, ඉන්දික රත්නායක

**පිළිසඳර අනුකමිටුව**

මහේෂ් ප්‍රසන්න, ශාන්ත ගුණරත්න, විමල් ප්‍රියශාන්ත, තිලක් පුෂ්පකුමාර, ඩබ්. සුජිත් අනුෂ්ක පෙරේරා, එස්.ඒ.ජී. සමීර.

**සමාජසේවා අධ්‍යක්ෂ**

**සමාජසේවා අනුකමිටුව**

ප්‍රියන්ත අබේසුන්දර, කුමාර කරව්දෙණිය, ඉන්දික හෙට්ටිආරච්චි, සුජාතා පතිරාජ, නෙරංජන් හෙට්ටිආරච්චි, මුදිත විජේසූරිය, ඩී.එම්.අයි. තීක්ෂණ, ආර්.ඒ.සී.එස්.කේ. විජේසිංහ, ජන්මිත ජයවීර, ප්‍රදීප් වෙදමෙස්ත්‍රිගේ, එස්. සුනේත්‍රා, ප්‍රියංකර ගමගේ.

## පංති භාර ආචාර්ය භවතුන්

2009 අධ්‍යයන වර්ෂයේ සංගමයේ ඡායාරූප පාඨමාලා පංති භාර සම්බන්ධීකාරක ආචාර්යවරු මතු දැක්වේ. ඒ ඒ පංතිවල සියලු කළමනාකරණ කටයුතු සංවිධානය ඒ මහතුන් විසින් සිදු කෙරෙනු ඇත.

| | |
|---|---|
| ප්‍රථම වසර | : සංඛ සම්මාන පෙරේරා මහතා 077 3485224 |
| දෙවන වසර | : අශෝක ජේමසිරි මහතා 071 2238411 |
| තෙවන වසර | : එස්.ඩී. පියදාස මහතා 077 4041937 |

## සාමාජිකත්වය රැකගනිමු.

සංගමයේ පැවැත්ම උදෙසා 2009 වර්ෂයට හිමි ඔබේ සාමාජික මුදල නොපමාව ගෙවන්න. මෙතෙක් එය නොගෙවූයේ නම් ගරු මුදල් අධ්‍යක්ෂ, හෝ මුදල් කමිටුවේ නියෝජිතයෙකු වෙත සාමාජික මුදල ලබා දී සාමාජිකත්වය තහවුරු කරගන්න. සංගමයේ සෑම කාර්යයක දී ම ඔබේ වලංගු සාමාජික හිමිකම, එනම්, හැඳුනුම්පත සහ වාර්ෂික සාමාජික ගාස්තු ගෙවූ රෝස පැහැති කාඩ්පත ඔබ සතුව තිබීම අත්‍යවශ්‍ය වේ.

## www.napsslanka.org සංගමයේ වෙබ් අඩවිය

උක්ත ලිපිනයැති සංගමයේ වෙබ් අඩවියෙහි සාමාජික ඔබසැමගේ ද නම් ඇතුළත් කිරීමට තීරණය කොට ඇත. ඒ සමග පළකිරීම පිණිස ඡායාරූප ශිල්පයේ ඔබ විශේෂ නිපුණතාවක් දක්වන ක්ෂේත්‍රය/ක්ෂේත්‍ර කවරේ දැ යි සෑම දිනක ම ප.ව. 8.00 - 9.00 ත් අතර දුරකථනයෙන් උපුල් රණේපුර (071 6005600) වෙත දැනුම් දෙන්න. පිටස්තරව විද්‍යුත් කැපැල් මගින් සිදුකෙරෙන සාමාජික ආමන්ත්‍රණ සහ විමසීම් සඳහා member@napsslanka.org යන ලිපිනය විවෘතව තැබෙනු ඇත.

## ව්‍යාජ ලිපි ලේඛන සකස් කිරීම

සංගමයේ 56වන වාර්ෂික මහා සභා රැස්වීම සඳහා සංගමයේ හිටපු විධායක අධ්‍යක්ෂ එන්. ආර්. අභයසිංහ මහතා විසින් සාමාජිකත්වය වෙත යවනු ලැබූ ආරාධනා පත්‍රයේ කොටස් සහ ඔහුගේ අත්සන කූට ලෙස පිටපත් කර, අනුපම සේනාධීර මහතා විසින් තෙවැනි ඇස සඟරාවට සංගමයේ වර්තමාන ක්‍රියාපිළිවෙත පිළිබඳ වැරදි අවබෝධයක් ඇතිවන ආකාරයෙන් ලියූ ලිපියත් සමග සමහර සාමාජිකයින් වෙත තැපැල් කිරීම නිසා සාමාජිකයින් හමුවේ අභයසිංහ මහතා බලවත් සිත් තැවුලට පත්විය. මේ පිළිබඳව නීතිමය පියවර ගැනීමට සංගමය මේ දැනටමත් කටයුතු කර ඇත. මේ සම්බන්ධ වැඩිදුරපරීක්ෂණ මිරිහාන පොලීසිය මගින් පවත්වනු ලැබේ.

## ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ
# 2010 වජ්‍ර ජයන්ති වැඩසටහන් කමිටුව.

**කමිටුව සම්බන්ධීකාරක ඇමතුම**

1. ප්‍රදර්ශන කමිටුව එන්.ආර්. අභයසිංහ මහතා 0777 688879
2. මුද්දර කමිටුව ඩින්ටන් ජයසූරිය මහතා 041 5679455
3. ප්‍රකාශන කමිටුව විජය බස්නායක මහතා 071 8229204
4. මූල්‍ය කමිටුව සුනිල් ලියනගේ මහතා 077 2614360
5. ප්‍රචාරක කමිටුව උදේනි අල්විස් මහතා 0777 751819
6. සංග්‍රහ කමිටුව චම්පා කුරුප්පු මෙණෙවිය 077 4698122
7. සාමාජික සහයෝගිතා කමිටුව ඒ.ඩී. ගුණරත්න මහතා 071 6390610
8. උත්සව සංවිධාන කමිටුව තිලක වෙරළුපිටිය මහතා 077 3231676
9. ආරක්ෂක කමිටුව චායා අබේවර්ධන මහතා 077 6114700
10. සැලසුම් කමිටුව උ.ග. ගුණසේකර 071 8106680
    - i. අනුග්‍රාහකත්ව අනුකමිටුව සුනිල් වික්‍රම මහතා 071 2726517
    - ii. සම්මන්ත්‍රණ අනුකමිටුව චන්ද්‍රසේන පෙරේරා මහතා071 4749435
    - iii. සැරසිලි අනුකමිටුව කුමාර කරව්වෙණිය මහතා 071 6144223
    - iv. ශාලා සැලසුම් අනුකමිටුව ප්‍රියන්ත අබේසුන්දර මහතා 0777 416663
    - v. බැනර් අනුකමිටුව ජීවනී ශ්‍රියා ප්‍රියන්ති මෙණෙවිය 071 8183669
    - vi. වෙළඳ කුටි අනුකමිටුව සම්පත් පීරිස් මහතා 071 8202444
    - vii. අධ්‍යාපනික ප්‍රදර්ශන අනුකමිටුව වජිර වික්‍රමගේ මහතා 011 2670790
    - viii. සමරු භාණ්ඩ අනුකමිටුව අශෝක බුද්ධදාස මහතා 071 4402950
    - ix. කාර්යමණ්ඩල කළමණාකරණ අනුකමිටුව රාහුල පෙරේරා මහතා 0777 309432
    - x. පවිත්‍රතා කටයුතු අනුකමිටුව අශෝක ජේමසිරි මහතා 071 2238411

මෙයට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන සම්බන්ධීකරණ වගකීම ද, මෙහෙයුම් හා ඇගයුම් කටයුතු පිළිබඳ වගකීම ද, ප්‍රගති සමාලෝචන කාර්යය ද ඉටුකරනු ඇත.

## සුබ මංගලම්



සංගමයේ ජ්‍යෝෂ්ඨ සාමාජිකා සහ ලංකා ප්‍රභාලේඛිකා සංසදයේ වර්තමාන සභාපතිනිය වන යමුනි රශ්මිකා පෙරේරා මෙණෙවිය පසුගිය මැයි මස 22 වැනි දින ප්‍රභාත් බන්දුලසේන මහතා සමග අතිනත ගත්තා ය. එම දෙපළට අපේ සුබපැතුම්.



සංගමයේ ඩිප්ලෝමා වසර විද්‍යාර්ථියකු වන ඉන්දික හෙට්ටිආරච්චි මහතා, ජසින්තා ප්‍රනාන්දු මෙණෙවිය සමග පසුගිය ජූනි මස 21 දින අතිනත ගත්තේ ය. මෙම විවාහ මංගලෝත්සවය අප සංගම් මූලස්ථානයේ පැවැත්වීම ද විශේෂත්වයකි. නව යුවළට සංගමයේ සුබපැතුම්.

## නාට්‍ය අනුමණ්ඩල සභාපතිත්වය ආචාර්ය පැට්‍රික් රත්නායකට

සංස්කෘතික අමාත්‍යාංශයේ කලා මණ්ඩලය යටතේ වන නාට්‍ය අනුමණ්ඩලයේ සභාපතිත්වය අප සාමාජික ආචාර්ය පැට්‍රික් රත්නායක මහතාට පිරිනමා ඇත. දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනය උදෙසා සුවිශිෂ්ට වූ කාර්යභාරයක් ඉටු කරලීමට ඒ මහතාට සුබපැතුම් පිරිනමමු.

## ඉදිරි කාලයේ ඡායාරූප පංති

අධ්‍යාපන අංශයේ මෙහෙයවීමෙන් පැවැත්වෙන ඡායාරූප පංති මාලාවේ ඉදිරි සැලසුම මතු දැක්වේ. පංති සුපුරුදු පරිදි කොළඹ 10, මහාබෝධි විද්‍යාලයේ ඉරුදින ප.ව. 1.30 සිට ප.ව. 4.30 තෙක් පැවැත්වේ.

**අගෝස්තු** - 02, 09, 30

**සැප්තැම්බර්** - 06, 20, 27

**මීගමු චාරිකාව** - අගෝස්තු 22

**සත්වෝද්‍යාන චාරිකාව** - 23

## මහාබෝධි බිතු සිතු සරණිය.




*කොළඹ මහාබෝධි විද්‍යාලයේ විදුහල්පතිතුමන් සහ විදුහලෙන් සංගමයට ලැබෙන අතහිත දීමට කෘතවේදීත්වය පළකිරීමක් වශයෙන් පාසලේ තාප්පයේ චිත්‍ර ඇඳීමේ ව්‍යාපෘතියක් පසුගිය දා සංවිධානය කෙරුණි. ජ්‍යෝෂ්ඨ සාමාජික ප්‍රියන්ත අබේසුන්දර මහතාගේ මෙහෙයවීමෙන් සිදුකෙරුණු මෙම ව්‍යාපෘතිය නුවර යුගයේ චිත්‍ර ශෛලිය නූතන ආදර්ශනයක් ලෙසින් සැලසුම් කෙරිණි. අබේසුන්දර මහතාගේ ප්‍රතිභාන්විත රූප සැලසුම පාසල් තාප්පයේ සලකුණු කිරීමට ලංකාවේ රොබියලැක් ආයතනය වර්ණ සම්පාදනය කළේ ය. අපේ සාමාජිකයෝ පුරා දින 10 ක් මුළුල්ලෙහි නිර්මාණ කාර්යයට උරදුන්හ.*

*ලක්දිව අන් කිසිඳු පාසලක දක්නට නොමැති විශිෂ්ටත්වයකින් යුත් මෙම බිතුසිතුවම් පෙළ ජූලි 21 වන දින පෙරවරුවේ බස්නාහිර පළාත් අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂතුමන් සහ ලංකෙම් සමාගමේ ලාංඡන කළමනාකාරතුමිය අතින් සිසු අයිතියට පවරා දෙනු ලැබිණි.*

*මෙම සුවිශේෂ ව්‍යාපෘතිය අති සාර්ථක අයුරින් සඵල කරගැනීම සඳහා අතහිත දුන් මහාබෝධි විදුහල්පති, උපාලි ලියනගේ මහතාණන්වත්, ලංකාවේ රොබියලැක් ලාංඡන කළමනාකාරිණී චමිලා ප්‍රියංගනී මහත්මියටත්, ලංකාවේ සමාගම් සම්බන්ධීකරණ කාර්යය ඉටුකළ හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂ ශාන්ති ලාල් ප්‍රනාන්දු මහතාටත්, නිර්මාණ කාර්යය සඳහා විවිධ අයුරින් සහාය වූ සියලුම සාමාජික භවතුන්ටත්, නිර්මාණකරණයේ මූලිකත්වය ගත් ප්‍රියන්ත අබේසුන්දර මහතා සමග ඊට දායක වූ පහත සඳහන් පාඨමාලා විද්‍යාර්ථීන්ටත්. සංගමයේ සැමදෙනාගේ හරසර සහ කෘතවේදීත්වය පිරිනැමේ.*

*රුවනි දිසානායක, ඩබ්.බී.ජේ. එස්. රාජකරුණා, අනුරුද්ධ කෝරළේවිදාන, අජිත් සමන් කුමාර, බුද්ධිකා ප්‍රියන්ති, දුලන ජිත්මාල්, හංසිනී ප්‍රභාශ්වරී, එස්.ඒ.ඒ.ඒ. රණසිංහ, ප්‍රේමසිරි හිදැල්ලආරච්චි, ගාමිණී බස්නායක. ඩී.එම්.අයි. තීක්ෂණ, ඒ.ආර්.බී.පී. කුමාරි, සංජීව බණ්ඩාර. දිනූෂා වැලිකල, නිලන්ත කුමාර, ඒ.එෆ්.ජේ. පෙරේරා, එම්.එම්.එම්.ආර්. කුමාර, ආර.එම්.ජී.කේ. රත්නායක, ප්‍රදීප් වෙදමෙස්ත්‍රිගේ.*

*මෙයට අමතරව තිනේෂා එදිරිසිංහ, එස්.ඩී. පියදාස, කුමාර කරව්දෙණිය, බන්දු ගුණරත්න, සුනන්ද කෝදාගොඩ, මහේෂ් ප්‍රසන්ත යන ජ්‍යෝෂ්ඨ සාමාජික භවතුන් ද මෙම කාර්යය සාර්ථක කර ගැනීමට දායක වූහ.*

# 2009 මාසික ඡායාරූප තරග

සංගමයේ පාඨමාලා හදාරන විද්‍යාර්ථීන්ගේ නිර්මාණශීලිත්වය වැඩි දියුණු කිරීම අරබයා පැවැත්වෙන මාසික ඡායාරූප තරග 2009 වසර සඳහා දැනට 04 ක් සංවිධානය කොට ඇත. ඒවායේ ජයග්‍රාහක නාමලේඛන සහ කෘති තේරීම සහ විචාරයට දායක වූ දෙවු සාමාජික පිරිස පහත සඳහන් ය

**01 වන මාසික තරගය - 2009 මාර්තු 29**

**සමස්ත තරග ප්‍රතිඵල.**

| වර්ණ | කලු සුදු |
|---|---|
| 01.චින්තක තේනුවර | 01. චින්තක තේනුවර |
| 02.එස්.එම්.සී.එල්. පුෂ්පමාල් | 02.ඩී.එන්. අනෝජා පෙරේරා |
| 03.චමින්ද ප්‍රසාද් අබේකෝන් | 03.හර්ෂ හිරෝෂණ කත්‍රිආරච්චි |
| 04.ගයනි හර්ෂණී අත්තනායක | 04.හර්ෂ හිරෝෂණ කත්‍රිආරච්චි |
| 05.චෙනුර ද සිල්වා | 05.රසික පෙරේරා |

**ඇගයීම් කමිටුව**

සුනිල් වික්‍රම මහතා
ප්‍රියන්ත අමරසිංහ මහතා
ප්‍රියන්ත අබේසුන්දර මහතා

**02 වන මාසික තරගය - 2009 මැයි 17**

**සමස්ත තරග ප්‍රතිඵල.**


| වර්ණ | කලු සුදු |
|---|---|
| 01.එච්.ඒ. ප්‍රේමසිරි | 01.ඩී.එන්. අනෝජා පෙරේරා |
| 02.ඩී.එන්. අනෝජා පෙරේරා | 02.චින්තක තේනුවර |
| 03.හර්ෂ හිරෝෂණ කත්‍රිආරච්චි | 03.චින්තක තේනුවර |
| 04.පැතුම් රංගන | 04.පී.ඩී. දිල්ෂාන් |
| 05.එල්.එන්.ජී.සී. නිලන්ත කුමාර | 05.දිනේෂ් කුමාර |

**ඇගයීම් කමිටුව**


සුනිල් ලියනගේ මහතා
ප්‍රියන්ත අබේසුන්දර මහතා
චමින්ද ප්‍රියන්ජිත් උපසේන මහතා

**03 වන මාසික තරගය - 2009 ජූනි 14**

**විහාරමහාදේවී උද්‍යාන ඡායාරූප තරගය ( බන්දු ගුණරත්න ශූරතා පලිහ)**



විහාරමහාදේවී උද්‍යාන ඡායාරූප තරගය කලු සුදු ප්‍රථම ස්ථානය පී.එච්.එච්. ලක්මාලි



2009 ජූලි මස මාසික තරගය කලු සුදු ප්‍රථම ස්ථානය චින්තක තේනුවර

**සමස්ත තරග ප්‍රතිඵල.**

| වර්ණ | කලු සුදු |
|---|---|
| 01.පැතුම් රංගන | 01.පී.එච්.එච්. ලක්මාලි |
| 02.දිනූෂා වැලිකල | 02.හර්ෂහිරෝෂණ |
| 03.රුවනි ප්‍රියංගා දිසානායක | 03.පැතුම් රංගන |
| 04.ඩී.එන්. අනෝජා පෙරේරා | 04.පැතුම් රංගන |
| 05.එල්.එන්.ජී.සී. නිලන්ත කුමාර | 05.පැතුම් රංගන |

**ඇගයීම් කමිටුව**

එච්.එම්.ආර්. පෙරේරා මහතා
ප්‍රියන්ත අබේසුන්දර මහතා

**04 වන මාසික තරගය - 2009 ජූලි 12**

**සමස්ත තරග ප්‍රතිඵල.**

| වර්ණ | කලු සුදු |
|---|---|
| 01.රසික පෙරේරා | 01.චින්තක තේනුවර |
| 02.එල්.ඒ.අයි. කරුණාරත්න | 02.පැතුම් රංගන |
| 03.පැතුම් රංගන | 03.චින්තක තේනුවර |
| 04.නොයෙල් වසන්ත | 04.දිනේෂ් කුමාර |
| 05.ඒ.ආර්. බුද්ධිකා ප්‍රියන්ති | 05.හර්ෂ හිරෝෂණ |

**ඇගයීම් කමිටුව**

ආචාර්ය උදිත ගුණසේකර මහතා
නාරද අමරතුංග ආරච්චිගේ මහතා
ප්‍රියන්ත අබේසුන්දර මහතා

**අපේ ශෝකය**

- සම්මානනීය සිනමාවේදී ෂෙල්ටන් පයාගල මහතා අප අතරින් වියෝ විය. ඒ පිළිබඳ සංගමයේ ශෝකය පළකරමු.
- ඩිල් ෆිල්මිස් අධිපති ඩිල්මන් ජයරත්න මහතා අභාවප්‍රාප්ත විය. එතුමන්ගේ අභාවය පළිබඳව එම පවුලේ සැම දෙනා වෙත සංගමයේ බලවත් ශෝකය පළකර සිටිමු.
- ක්‍රියාකාරී සාමාජික අශෝක බුද්ධදාස මහතාගේ නැන්දණිය අභාවප්‍රාප්ත විය. ඒ සම්බන්ධව සංගමයේ සියලු දෙනාගේ ශෝකය පිරිනමමු.
- ක්‍රියාකාරී සාමාජික චම්පා කුරුප්පු මෙණෙවියගේ මාමණ්ඩිය අප අතරින් වෙන් විය. ඒ පිළිබඳ සංගමයේ ශෝකය පළකරමු.

**පිළිසඳරට වෙහෙස මහන්සිය**

ශාන්ත ගුණරත්න
මහේෂ් ප්‍රසන්න
උදිත ගයාෂාන් ගුණසේකර
ප්‍රභාත් චතුරංග
විමල් ප්‍රියශාන්ත
තිලක් පුෂ්පකුමාර
සුජිත් අනුෂ්ක පෙරේරා
එස්.ඒ.ජී. සමීර
නිශාන්ත ප්‍රියදර්ශන

**කැමරා පොළ**

Cameras
Nikon F 5, Nikon F 90X, Nikon D 80 Camera Bodies
Nikon FM 10 with 35 ~ 70 mm lens
Nikon EM Black body with 50 mm f 1.4 lens
Lenses
Minolta Manual 28 mm, F 3.5
Nikon Manual 50 mm, F 1.4
Nikon 24~ 120 mm D type F 3.5
Nikon 70 ~ 300 mm ED, F.4
Nikon 35 ~ 105 mm D type F. 3.5
Nikon 28 ~ 70 mm AF F. 3.5
Nikon 105 micro VR, AF
Nikon ED, DX, F 2.8
Tripod
Battery Pack (with two Batteries)
Metz TTL Flash - G 48
Nikon 28 ~ 100 mm G type Lens
**ප්‍රභාත් - 0716 199 200**

**පිළිසඳරට ඔබේ තොරතුරු**

අමතන්න - **මහේෂ් 071 6021502**
**ශාන්ත 0777 519679**